**මෙවැනි රසායනික ද්‍රව්‍ය එදිනෙදා පාසලේදී හමුවන ස්ථාන,**

1. පාසල් විද්‍යාගාරය තුළ
2. විවිධ ආකාරයේ පිරිසිදුකාරක, විෂබීජ නාශක, විරංජක ලෙස
3. කෘමිනාශක, වල්නාශක ලෙස
4. ගොඩනැගිලි ඉදිකිරීමට යොදාගන්නා ද්‍රව්‍ය (Paint, varnish)
5. ඇතැම් පාසල් උපකරණ Art & stationary materials.
6. ඇතැම් ආහාර පාන

**විෂ රසායනික ද්‍රව්‍යවලට නිරතුරුවම භාජනය වීම නිසා**

**කෙටි කාලීනව**

1. වමනය.
2. ඔක්කාරය/පිළිකුල් ස්වභාවය.
3. බඩෙහි ඇතිවන වේදනා.

**දිගු කාලීනව**

1. මතකය අඩුවීම.
2. ගැටලු විසඳීමේ හැකියාව අඩුවීම.
3. සිත යොමු කිරීමේ හැකියාව/අවධානය අඩුවීම.
4. ප්‍රතිචාර දැක්වීමට ගතවන කාළය වෙනස් වීම.
5. පෞරුෂත්වය හා සිතේ ස්වභාවය වෙනස් වීම.
6. සිරුරේ ඇති විවිධ අත්‍යවශ්‍ය ඉන්ද්‍රියන්ට (වකුගඩු/අක්මාව) හානි පැමිණවීම.

**විෂ රසායනික ද්‍රව්‍යවලට නිරාවරණය වීම නිසා ඇතිවන අහිතකර ප්‍රතිඵල පහත හේතූන් මත රදා පවතී.**

1. රසායනික ද්‍රව්‍යයේ ප්‍රභලත්වය මත (ධූලකතාවය)
2. ශරීරගත වූ මාර්ගය (සම, අධිග්‍රහණය, ආශ්වාසය)
3. අනාවර්තවූ කාළය (පැය, දින, සති, මාස, වසර)

**කුඩා දරුවන්ගේ ශරීර ප්‍රමාණය වැඩුනු පුද්ගලයෙකුට වඩා අඩු බැවින් එකම ආකාරයේ රසායනික ද්‍රව්‍යයකට එකම කාළ පරාසයක් තුළ මුහුණ දුන්නද ඇතිවිය හැකි බලපෑම් දරුවන්ට ඉහල වේ.**

පාසලක් තුළ භාවිතාවන රසායනික ද්‍රව්‍ය නිසි ආකාරයෙන් කළමනාකරනය සිදුකිරීම මගින් ඇතිවිය හැකි අනතුරු වළක්වා ගැනීම සඳහා,

- මිලදී ගැනීමේදී නිවැරදි තීරණ ගැනීම.
- ක්‍රමානුකූලව බඩු ලේඛන පරීක්ෂාව.
- ආරක්ෂාකාරී ගබඩා කිරීම්.
- හරිත රසායනික ක්‍රම අනුගමනය කිරීම.
- නිවැරදි ආකාරයෙන් බැහැර කිරීම සිදුකල යුතුය.

## "හරිත රසායනික ක්‍රම" ඔබ එය දන්නවාද?



හරිත රසායනික ක්‍රම යනු, විෂ රසායනික භාවිතයේදි ඇතිවන අවධානම් තත්ත්වය අවම කරගැනීම සඳහා උපයෝගි කරගන්නා රසායනික ක්‍රම වේදයන්ය. පාසල් විද්‍යාගාරයේ දී ඔබගේ රසායනික පරීක්ෂණ සැලසුම් කිරීමේදී පහත සඳහන් ක්‍රියා අනුගමනය කළ හැකි නම් අගනේ ය.

1. සෑදෙන අපද්‍රව්‍ය අවම කිරීම.
2. උපරිම ඵල ප්‍රමාණයක් ලැබෙන ලෙස ප්‍රතික්‍රියා සිදුකිරීම.
3. විෂ රසායනික ද්‍රව්‍ය වෙනුවට ධූලකතාව අවම රසායනික ද්‍රව්‍ය භාවිතය.
4. සෑදෙන අපද්‍රව්‍ය වල ධූලකතාව අවමවන පරිදි ප්‍රතික්‍රියක නිර්මාණය කිරීම.
5. සැම විටම ධූලකතාවයෙන් අඩු දියකාරක යොදා ගන්න.
6. රසායනික ප්‍රතික්‍රියා උපරිමව සිදුවීමට අවශ්‍ය උෂ්ණත්වය හා පීඩනය ලබාදීම.
7. නැවත නැවතත් යොදාගත හැකි අමුද්‍රව්‍ය භාවිතා කරන්න.
8. ප්‍රතික්‍රියාවක සෑදෙන ව්‍යුත්පන්න අවම කිරීම.
9. ප්‍රතික්‍රියාව හොඳින් සිදුවීමට උත්ප්‍රේරක යොදා ගන්න.
10. ප්‍රතික්‍රියාවක් අවසාන වන සැමවිටම හායනය වන සංයෝග ලැබෙන ලෙස සකස් කිරීම.
11. සැම විටම නියමිත ඵලය සෑදෙන වේලාව ගණනය කරන්න.
12. ප්‍රතික්‍රියාවක් සැලසුම් කිරීමේදී අනතුරු අවම වන ලෙස සංයෝග තෝරා ගැනීම.

මෙවැනි ආරක්ෂක ක්‍රම අනුගමනය කිරීමෙන් ඉදිරියේදී ඇතිවිය හැකි පාරිසරික ගැටලු හා සෞඛ්‍ය ගැටලු වලින් මිදීමේ හැකියාව ලැබේ.

**සෑම විටම ආරක්ෂාකාරීව රසායනික ද්‍රව්‍ය භාවිතා කරන්න.**

මූල්‍ය අනුග්‍රහය
එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහනේ
ජගත් පාරිසරික පහසුකම් සුළු මූල්‍යාධාර වැඩසටහන

# විෂ රසායනික ද්‍රව්‍ය



**සෑම විටම ආරක්ෂාකාරීව රසායනික ද්‍රව්‍ය භාවිතා කරන්න.**

පරිසර යුක්ති කේන්ද්‍රය
20/A, කුරුප්පු පාර, කොළඹ 08.
දුරකථන: ++94-11-2683282
email: info@ejustice.lk web: www.ejustice.lk

*SAICM NGO focal point of Sri Lanka*



## ගිනි ඇවිලෙන සුලුයි (flammable)

- ඇතැම් රසායනික ද්‍රව්‍යයන්ට ඉක්මනින් ගිනි ඇවිලීමේ හැකියාව පවතියි.
- එය ද්‍රවමය, වායුමය හෝ ඝණමය විය හැක. (ඇසිටෝන්,ඇල්කොහොල්)

**උදා**

විද්‍යාගාරයේ රසායනික ද්‍රව්‍ය, තීන්ත තුනීකාරක ඇලවීම සඳහා යොදා ගන්නා ද්‍රව්‍ය

**භාවිතයේදී පිළිපැදිය යුතු ආරක්ෂාකාරී ක්‍රියාමාර්ග**

- භාවිතයේ දී දැල්ලක් ආසන්නයේදී විවෘත නොකරන්න.
- ගබඩා කිරීමේදී අනෙකුත් රසායනික ද්‍රව්‍ය වලින් වෙනම ගබඩා කිරීම.



## විඛාදනශීලී (corrosive)

- රසායනික ප්‍රතික්‍රියාවක් මඟින් සජීවී පටකයන් පිලිස්සීමට, කැඩීමට හෝ විනාශ කිරීමට හැකියාව ඇති හෝ ලෝහවර්ග විඛාදනය කිරීමේ හැකියාවක් ඇති රසායනික සංයෝග මෙම ගණයට අයත් වේ.

උදා: ප්‍රබල භෂ්ම හා අම්ල

**භාවිතයේදී පිළිපැදිය යුතු ආරක්ෂාකාරී ක්‍රියාමාර්ග**

- ආරක්ෂාකාරී කණ්නාඩි පැලදීම.
- අත් දිගට ඇති ඇදුම් ඇඳීම.
- භාවිතා කිරීමේදී සිරුර හොඳින් ආවරණය වන ආකාරයෙන් ඇදුම් ඇඳීම.
- සැම විටම අත් වැසුම් භාවිතා කිරීම.



ඔබ එදිනෙදා පාසල තුළදී, නිවසේදී හෝ වෙනත් ස්ථානයක භාවිතා කරන රසායනික ද්‍රව්‍ය අඩංගු බහාලුම්වල පහත සඳහන් (ලේබල්) සංකේත අඩංගුදැයි මදක් විමසා බැලුවාද? බොහෝමයක් එවැනි සලකුණු අඩංගු රසායනික ද්‍රව්‍ය මඟින් ඔබේ සෞඛ්‍යයට කෙටිකාලීන හෝ දිගුකාලීන බලපෑම් ඇති කල හැක.



## දරුණු නිදන්ගත සෞඛ්‍ය ගැටලු ඇති කරයි.
## Severe chronic hazard

මෙම රසායනික ද්‍රව්‍යයේ කුඩා ප්‍රමාණයක් මගින් පිළිකා වැනි දරුණු රෝග තත්වයන් ඇතිවිය හැක.

**භාවිතයේදී පිළිපැදිය යුතු ආරක්ෂාකාරී ක්‍රියාමාර්ග**

- ආහාරපාන ලෙස නොගැනීම.
- ආරක්ෂාකාරී කණ්නාඩි පැලදීම.
- අත් වැසුම් භාවිතා කිරීම.
- හැකිතාක් සිරුර හොඳින් ආවරණය වන ආකාරයෙන් ඇදුම් ඇඳීම.



## විෂ සහිතයි (toxic)

සුලු ප්‍රමාණයකින් හෝ අධිග්‍රහණයකදී, ආග්‍රහණය වීමකදී, සම මගින් උරා ගැනීමකදී සජීවී පටකයට හානි කල හැකි රසායනික සංයෝග.

උදා : රසදිය, ඇස්බැස්ටෝස්, සයනයිඩ්, ලෙඩ්

**භාවිතයේදී පිළිපැදිය යුතු ආරක්ෂාකාරී ක්‍රියාමාර්ග**

- භාවිතයේ දී ආහාර නොගැනීම.
- හැකිතාක් සිරුර හොඳින් ආවරණය වන ආකාරයෙන් ආරක්ෂාකාර ඇදුම් ඇඳීම.
- සැම විටම අත් වැසුම් භාවිතා කිරීම.
- හැකි සැම විටම මුඛ වැසුම් පැලදීම.



## විෂ අවම වේ
## Law level hazard

මෙම රසායනික ද්‍රව්‍ය හානි ගෙන දෙන්නේ ගිලීමකදී, ආග්‍රහණයකදී හෝ සම සමඟ ගැටීමකදීය. මේවා ඇසේ, සමේ හෝ ස්වසන පද්ධතිය ආශ්‍රිත ව්‍යුහවල ඇතිවන කැසීම්වලට හේතුවේ.

**Eg:** $NH_4NO_3$, $FeSo_4$

**භාවිතයේදී පිළිපැදිය යුතු ආරක්ෂාකාරී ක්‍රියාමාර්ග**

- භාවිතා කිරීමේදී සිරුර හොඳින් ආවරණය වන ආකාරයෙන් ඇදුම් ඇඳීම.
- ආරක්ෂාකාරී කණ්නාඩි පැලදීම.
- කිසිම විටකදී ආහාරයක් හෝ පානයක් ලෙස නොගැනීම.
- සැම විටම අත් වැසුම් භාවිතා කිරීම.



## ඔක්සිකාරක (Coxidizing)

- ඔක්සිජන් නිපදවමින් ගිනි ඇවිලීම් හෝ විඛාදනය සිදුවිය හැකිය.

උදා : නයිට්‍රේට්, ක්ලෝරේට්, පෙරොක්සයිඩ්

**භාවිතයේදී පිළිපැදිය යුතු ආරක්ෂාකාරී ක්‍රියාමාර්ග**

- විවෘත දැල්ලක් ආසන්නයේ භාවිතා නොකරන්න.
- භාවිතා කිරීමේදී සිරුර හොඳින් ආවරණය වන ආකාරයෙන් ඇදුම් ඇඳීම.
- සැම විටම අත් වැසුම් භාවිතා කිරීම.



## පරිසරයට හානිකාරක ද්‍රව්‍ය
## Environmental hazard

පරිසරයේ සිටින විවිධ ජීවින්ට අහිතකර බලපෑම් ඇති කිරීමට හැකියාවක් ඇති ද්‍රව්‍ය වේ.

**භාවිතයේදී පිළිපැදිය යුතු ආරක්ෂාකාරී ක්‍රියාමාර්ග**

නල මාර්ග හා කාණු පද්ධති හරහා ඉවත් නොකිරීම/ ප්‍රතිචක්‍රීකරණය කිරීම.